# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/48 – 2023 අගෝස්තු මස 16 වැනි බදාදා – 2023.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2019 ජූනි මස 19 වැනි දින අංක 2128/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2019 අංක 122 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2019/HW/36.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය:DEV/LND/02/ACQUI/05-11.
2023 ජූනි මස 21 වැනි දින.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 449A, කඩවැද්දුව බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පල්ලෙ අපරැක්ක (හිගුරුපත්තල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක: මාර 2850 හා 2020.09.14 දිනැති මූලික පිඹුරේ සවිස්තරව පෙන්නුම් කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 3 – බදුවත්ත - ප්‍රමාණය: හෙක්. 0.0010**

උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කැබලි අංක 2; දකුණට: සී.ඩී.ඒ.රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත; බටහිරට: සී.ඩී.ඒ.රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත සහ මෙම පිඹුරේ කැබලි අංක 2.

EOG 08 – 0157